**ප්‍රවෘත්ති නිවේදනය**

# ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2025 ජනවාරි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2025 ජනවාරි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) -4.0%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2024 දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය -2.0ක් ලෙස වාර්තා විය. 2025 ජනවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -1.1%ක හා ආහාර නොවන කාණ්ඩයේ -2.9%ක දායකත්වයක් පිළිවෙළින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 දෙසැම්බර් මාසයේදී -1.0% සිට 2025 ජනවාරි මාසයේ -2.5% දක්වා අඩු වී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 දෙසැම්බර් මාසයේදී -2.9% සිට 2025 ජනවාරි මාසයේදී -5.2% දක්වා අඩු වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම:2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කළ විට, 2025 දෙසැම්බර් මාසයේ 204.6 ක් වූ දර්ශකාංකය, 2025 ජනවාරි මාසයේ දී 206.4 ක් දක්වා වැඩි වී ඇති බව වාර්තා විය. මෙය 2024 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2025 ජනවාරි මාසයේ දර්ශකාංකය 1.8ක වැඩිවීමක් එනම් 0.88ක ප්‍රතිශතාංක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 0.47% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩය 0.41% කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැලකූ විට මිලෙහි වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ පොල්, අමු මිරිස්, සහල්, එළවළු, අලුත් මාළු, පොල් තෙල්, රතු ළූණු, සියඹලා සහ ලුණු යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත් දෙහි, බී ළූණු, කුකුළු මස්, බිත්තර, කරවල, සීනි, අර්තාපල්, ටිංමාළු, අලුත් පලතුරු, මිරිස් කුඩු, මුංඇට, මයිසූර් පරිප්පු සහ සෝයා මීට් යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි අඩු වීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කළ විට, 2025 ජනවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා ‘අධ්‍යාපන’(අමතර පන්ති ගාස්තු), ‘ප්‍රවාහන’(වාහන සර්විස් කිරීමේ ගාස්තු), ‘මද්‍යසාර පාන වර්ග, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය’ (අරක්කු සහ සිගරැට්), 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු'(මෙහෙකාර වැටුප්), ‘සෞඛ්‍ය’(පුද්ගලික වෛද්‍ය ගාස්තු), ‘ආපනශාලා සහ හෝටල්’, ‘විවිධ භාණ්ඩ සහ සේවා’, ‘රෙදිපිළි සහ පාවහන්’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත්, ‘විනෝදාත්මක සහ සංස්කෘතික’(අභ්‍යාස පොත් සහ ලිපි ද්‍රව්‍ය) සහ ‘නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන’(විදුලි බිල) යන කාණ්ඩ වලට අයත් අයිතමයන්ගේ මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත. තවද, ‘සන්නිවේදන’ යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිල ජනවාරි මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2024 දෙසැම්බර් මාසයේ 1.3% සිට 2025 ජනවාරි මාසයේදී -0.2% දක්වා අඩු වීමක් වාර්තා විය.

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය**




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| 2024 | ජන. | 215.0 | 242.4 | 197.3 | 193.9 | 3.0 | 2.2 | 6.5 | 4.1 | 8.5 | 2.2 |
| | පෙබ. | 214.5 | 239.5 | 198.3 | 194.6 | -0.2 | 0.4 | 5.1 | 5.0 | 5.1 | 2.7 |
| | මාර්තු | 210.0 | 234.4 | 194.3 | 194.5 | -2.1 | -0.1 | 2.5 | 5.0 | 0.7 | 3.4 |
| | අප්‍රේල් | 208.2 | 231.1 | 193.4 | 193.9 | -0.9 | -0.3 | 2.7 | 3.3 | 2.3 | 3.0 |
| | මැයි | 206.3 | 227.3 | 192.8 | 193.6 | -0.9 | -0.2 | 1.6 | 0.5 | 2.4 | 3.1 |
| | ජූනි | 208.1 | 232.8 | 192.1 | 193.7 | 0.9 | 0.1 | 2.4 | 1.9 | 2.7 | 3.9 |
| | ජූලි | 206.9 | 234.0 | 189.4 | 193.7 | -0.6 | 0.0 | 2.5 | 2.9 | 2.2 | 3.0 |
| | අගෝ. | 204.1 | 229.7 | 187.6 | 193.0 | -1.4 | -0.4 | 1.1 | 2.3 | 0.2 | 2.3 |
| | සැප්. | 203.1 | 227.9 | 187.1 | 192.5 | -0.5 | -0.3 | -0.2 | 0.5 | -0.7 | 1.9 |
| | ඔක්. | 202.1 | 227.1 | 186.0 | 192.4 | -0.5 | -0.1 | -0.7 | 1.3 | -2.3 | 1.7 |
| | නොවැ. | 202.4 | 228.0 | 185.9 | 192.2 | 0.1 | -0.1 | -1.7 | 0.0 | -3.1 | 1.5 |
| | දෙසැ. | 204.6 | 233.9 | 185.7 | 192.1 | 1.1 | -0.1 | -2.0 | -1.0 | -2.9 | 1.3 |
| 2025 | ජන. | 206.4 | 236.3 | 187.1 | 193.6 | 0.9 | 0.8 | -4.0 | -2.5 | -5.2 | -0.2 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව